# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,724/7 — 1966 දෙසැම්බර් 7 වැනි බදාදා — 1966.12.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1964 අංක 11 දරණ කුඹුරු (සංශෝධන) පනත

1964 අංක 11 දරණ කුඹුරු (සංශෝධන) පනතේ 45 වෙනි වගන්තියෙන් තම වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර කෘෂිකර්ම හා ආහාර ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාව.

1966 නොවැම්බර් 22 වෙනි දින,
කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය,
යූනියන් පෙදෙස,
කොළඹ 2.

පී. සී. ඉඹුලාන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

45 වෙනි වගන්තිය යටතේ ආඥාව

1964 අංක 11 දරණ කුඹුරු (සංශෝධන) පනතෙහි 45 වෙනි වගන්තියේ කාර්යයන් සඳහා නියමිත දිනය, 1966 දෙසැම්බර් මස 13 වෙනි දින විය යුතුය.

12-637

---

## ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම්

### ශ්‍රී ලංකා මහ බැංකුව

1966 නොවැම්බර් මස 30 වැනි දිනට ශේෂ පත්‍රය

(මුදල් නීති පනතේ 34 වැනි (පරිච්ඡේදය 422) වගන්තියට අනුව)

**වගකීම්**

| | රුපියල් | රුපියල් |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | | |
| ප්‍රාග්ධනය ... ... | 1,50,00,000 | |
| අතිරික්තය ... ... | 5,30,00,000 | |
| | | 6,80,00,000 |
| වගකීම් | | |
| සංසරණයෙහි පවත්නා නෝට්ටු ... | 89,72,76,044 | |
| සංසරණයෙහි පවත්නා කාසි ... | 5,87,04,559 | |
| | | 95,59,80,603 |
| නිකුත් කළ හා බේරීමට ඇති ණයපත් ... | | 2,83,94,000 |
| තැන්පතු | | |
| රජය ... ... | 5,82,19,219 | |
| රාජ්‍ය නියෝජ්‍යත්ව හා සංස්ථා ... | 78,86,030 | |
| වෙළෙඳ බැංකු ... ... | 15,27,15,757 | |
| ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන ... | 29,09,26,945 | |
| අනෙකුත් ... ... | 92,36,191 | |
| | | 51,89,84,142 |
| විදේශීය ණය ගැනීම් ... ... | | 4,14,76,190 |
| අනෙකුත් වගකීම් හා ගිණුම් ... ... | | 27,70,36,899 |
| | | 1,88,98,71,834 |

**වත්කම්**

| | රුපියල් | රුපියල් |
|---|---|---|
| ජාත්‍යන්තර සංචිතය | | |
| පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් (භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව) | 4,30,19,424 | |
| *විදේශීය රාජ්‍ය ණයපත් ... | 10,03,91,592 | |
| | | 14,34,11,016 |
| දේශීය වත්කම් | | |
| ණය සහ අත්තිකාරම්— | | |
| †රජයට ... ... | 25,22,64,368 | |
| අනෙකුත් අයට ... | 4,72,16,171 | |
| රජයේ හා රජය සහතික කළ ණයපත් | 1,25,83,29,347 | |
| | | 1,55,78,09,886 |
| අනෙකුත් වත්කම් හා ගිණුම් ... ... | | 18,86,50,932 |
| | | 1,88,98,71,834 |

*(අ) 1964 පෙබරවාරි 1 වැනි දින රු. 4,50,37,797 ක ප්‍රකාශිත වටිනාකමට හා (ආ) 1965 මැයි 24 වැනි දින රු. 2,9[illegible],19,870 ක වටිනාකමට රජයේ ආයතන වලින් ලබාගත් ණයපත් ඇතුළත් වේ. ඒ දින වල මෙම ණයපත් වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම් පිළිවෙළින් රු. 3,58,22,832 ක් සහ රු. 2,53,54,318 ක් විය.

†ජාත්‍යන්තර මූල්‍ය ස විධානයන්ට ලංකාවේ දායක මුදල් වශයෙන් ගෙවීම සඳහා වූ රු. 8,23,64,368 ක විශේෂ ණය ද ඇතුළත් වෙයි.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන,
අධිපති.

එස්. ඩී. අමරසිංහ,
ප්‍රධාන ගණකාධිකාරී.

ඉහත සඳහන් ශේෂ පත්‍රය මගේ විධානය යටතේ පරීක්ෂා කරන ලදී. මහ බැංකුවේ පොත් හා වාර්තා සහ මා වෙත සපයා ඇති තොරතුරු හා විස්තර අනුව, 1966 නොවැම්බර් මස 30 වැනි දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු පිළිබඳ පැවැති තත්ත්වය සාධාරණව හා සත්‍යව පිළිබිඹු වන පරිදි ශේෂ පත්‍රය නිසි ලෙස සකස් කොට ඇති බව මගේ අදහස වෙයි.

බී. ඇල් ඩබ්ලිව්. ප්‍රනාන්දු,
ඔඩිටර් ජනරාල්.

1966 දෙසැම්බර් මස 7 වැනි දින, කොළඹ දී ය.

12–636

---

# මිල පාලන දැන්වීම්

**ආහාර මිල නියෝගය අංක ටී/4/66.** **මසූර් පරිප්පු**

## මිල පාලන පනත

### නියෝගය

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක තැන්පත්, රත්ගම ගුරුගේ ජයතිස්ස වන මම, (173 වන අධිකාරය) වන මිල පාලන පනතේ අංක 3 (2) දරණ වගන්තිය යටතේ කියවිය යුතු අංක 4 දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව :—

(1) 1963 සැප්තැම්බර් 4 වැනි දින අංක 13,749 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද අංක ටී/3/63 හා 1963 සැප්තැම්බර් 2 වැනි දින දරණ මාගේ ආහාර මිල නියෝගය අද මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් පරිදි පිටරට පාගින ලද මසූර් පරිප්පු (1. වැනි වර්ගය) සහ මෙරට පාගින ලද මසූර් පරිප්පු (2 වැනි වර්ගය) තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොන්ඩරයක් එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිල ගණන් බව මේ දත් පටන් මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මීට යාකොට ඇති 2 වැනි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් පරිදි පිටරට පාගින ලද මසූර් පරිප්පු (1 වැනි වර්ගය) සහ මෙරට පාගින ලද මසූර් පරිප්පු (2 වැනි වර්ගය) සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්, එම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිල ගණන් බව මේ දත් පටන් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද මෙම නියෝගයේ කාර්යය සඳහා—

(අ) මසූර් පරිප්පු පිටරට පාගින ලද (1 වැනි වර්ගය) සහ මෙරට පාගින ලද (2 වැනි වර්ගය) ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට දළ බර හොන්ඩරයකට වැඩි ඕනෑම ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) මසූර් පරිප්පු පිටරට පාගින ලද (1 වැනි වර්ගය) සහ මෙරට පාගින ලද (2 වැනි වර්ගය) පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ වරකට දළ බර හොන්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, මසූර් පරිප්පු පිටරට පාගින ලද (1 වැනි වර්ගය) සහ මෙරට පාගින ලද (2 වැනි වර්ගය) වෙනත් ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(6) තවද මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක මසූර් පරිප්පු පිටරට පාගින ලද (1 වැනි වර්ගය) සහ මෙරට පාගින ලද (2 වැනි වර්ගය), සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම ඉන් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍යය සඳහා මෙම නියෝගයෙන් නියම කරන ලද වැඩිම මිල උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිල පුවරුවක සටහන් කොට එම භාජනය හා සම්බන්ධ කර එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිල ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ, එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(7) එසේම මෙම නියෝගයේ කාර්යය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(8) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, මසූර් පරිප්පු පිටරට පාගින ලද (1 වැනි වර්ගය) සහ මෙරට පාගින ලද (2 වැනි වර්ගය )තොග වශයෙන් විකුණන සෑම වෙළෙන්දෙකුම හා මසූර් පරිප්පු පිටරට පාගින ලද (1 වැනි වර්ගය) සහ මෙරට පාගින ලද (2 වැනි වර්ගය) සිල්ලර වශයෙන් විකුණන සෑම වෙළෙන්දෙකුම විසින් මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව නියම කරමි.

(9) මසූර් පරිප්පු පිටරට පාගින ලද (1 වැනි වර්ගය) සහ මෙරට පාගින ලද (2 වැනි වර්ගය) විකුණන විට එය යම් කිසි දෙයක ඔතනු ලැබෙනම්, එහි මිළත් උපලේඛනයේ සඳහන් වැඩිම මිල ගණන්වලට ඇතුළත් වන බව නියම කරමි.

1966 දෙසැම්බර් මස 1 වැනි දින, ප.ව. 2.00 ට ත්‍රිකුණාමල කච්චේරියේදී අත්සන් කරන ලදී.

ආර්. ජී. ජයතිස්ස,
සහකාර මිල (ආහාර) පාලක, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය.

## පළමුවැනි උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය මසූර් පරිප්පු—තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොන්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | |
|---|---|---|
| සීමාවන් | පිටරට පාගින ලද (1 වැනි වර්ගය) රු. ශ. | මෙරට පාගින ලද (2 වැනි වර්ගය) රු. ශ. |
| ත්‍රිකුණාමල නගරය හා කඩවත් කරවන ප්‍රාදේශීය ආදයම් නිලධාරි නැනගේ කොට්ඨාශය ... ... | 56 40 | 46 60 |
| කොට්ඨියාර් පත්තුව, කින්නියාට, කන්තලේ, කට්ටුකුලම් පත්තුව නැගෙනහිර සහ කට්ටුකුලම් පත්තුව බටහිර යන ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයන් ... ... ... ... | 57 .5 | 47 35 |

## දෙවැනි උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය<br>මසූර් පරිප්පු—සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල | |
|---|---|---|
| සීමාවන් | පිටරට පාහින ලද (1 වැනි වර්ගය)<br>රු. ශ. | මෙරට පාහින ලද (2 වැනි වර්ගය)<br>රු. ශ. |
| ත්‍රිකුණාමල නගර සහා ප්‍රදේශය හා උප්පුවෙලි සහ සාම්පල්තීවු යන ග්‍රා. සේ. කොට්ඨාශ ... ... | 0 56 ... | 0 47 |
| කින්නියාව ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය තුළ පිහිටි සින්නකින්නියාව, පෙරිය කින්නියාව, කුරින්ජාකේනි, ආලන්කේනි, තම්පලකාමම් යන ග්‍රාමසේවක කොට්ඨාශ, ත්‍රිකුණාමල නගරය ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි චීනවරාය, වෙල්ලයිමනල් යන ග්‍රා. සේ. කොට්ඨාශ, නැගෙනහිර කට්ටුකුලම්පත්තුව ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි නිලාවෙලි, කුඹුරුපිටි යන ග්‍රා. සේ. කොට්ඨාශ සහ කොට්ටියාර් පත්තුව ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි මුතූර්, මෙන්කමම්, මල්ලිකයිතීවු, කට්ටයිපරිච්චාන්, සම්පූර්, කුනිතීවු සහ තෝප්පූර් යන ග්‍රා. සේ. කොට්ඨාශ ... ... ... ... ... | 0 57 ... | 0 48 |
| බටහිර කට්ටුකුලම්පත්තුව ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි ගොමරන්කඩවල, පැනිකැටියාව, මැදවච්චිය, ගල්කඩවල යන ග්‍රා. සේ. කොට්ඨාශ, කන්තලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි කන්තලේ ග්‍රා. සේ. කොට්ඨාශය, නැගෙනහිර කට්ටුකුලම්පත්තුව ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි කුච්චවෙලි, තිරියායි යන ග්‍රා. සේ. කොට්ඨාශ සහ කොට්ටියාර්පත්තුව ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි කිලිවෙට්ටි, පල්ලිකුඩියිරුප්පු යන ග්‍රා. සේ. කොට්ඨාශය ... ... ... ... ... | 0 58 ... | 0 49 |
| නැගෙනහිර කට්ටුකුලම් පත්තුව ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි පුල්මෝට්ටෙයි, තෙන්නමරවාඩි, පරණ-මැදවච්චිය යන ග්‍රා. සේ. කොට්ඨාශ සහ කොට්ටියාර්පත්තුව ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි ඊච්චිලාම්-පත්තයි යන ග්‍රා. සේ. කොට්ඨාශය ... ... ... ... ... | 0 59 ... | 0 50 |

සැලකිය යුතු.—ඉහත සඳහන් මිළ ගණන් ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය යුතු නියම මිළ නොවේ. ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මෙ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැක.

12-548/1

---

ආහාර මිළ නියෝගය අංකය ටී/5/66. ශුද්ධ කළ සුදු සීනි

## මිළ පාලන පනත

### නියෝගය

සහකාර මිළ පාලක (ආහාර) වෙත (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය සමඟ කියවෙන 4 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, ත්‍රිකුණාමල පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ පාලක (ආහාර) තැන්පත් රත්ගම ගුරුගේ ජයතිස්ස වන මම, මෙම නියෝගයෙන් පහත සඳහන් නියමයන් කරමි :—

(1) 1963 පෙබරවාරි 28 වෙනි දින හා අංක 13,538 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1963 පෙබරවාරි 25 දින හා අංක ටී/1/63 දරණ ආහාර මිළ නියෝගය මේ දින් සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති පළමුවැනි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් ශුද්ධ කළ සුදු සීනි තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොන්ඩරයක් සඳහා එම උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළතදී අයකළ හැකි වැඩිම මිළ බව නියෝග කරමි.

(3) මීට යාකර ඇති දෙවැනි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් ශුද්ධකළ සුදු සීනි සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක මිළ එම උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ප්‍රදේශවල මේ දින් පටන් විකිණිය හැකි වැඩිම මිළ බව නියෝග කරමි.

(4) තවද මෙම නියෝගයේ කාර්යය සඳහා—

(අ) ශුද්ධකළ සුදු සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ ශුද්ධ කළ සුදු සීනි වරකට දළ බර හොන්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) ශුද්ධකළ සුදු සීනි ඕනෑම ප්‍රමාණයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොන්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ඇ) " ශුද්ධකළ සුදු සීනි " යන්නට සියළුම වර්ගයේ හකුරු ඇතුළත් නොවන බවද නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම ශුද්ධකළ සුදු සීනි වෙනත් ද්‍රව්‍යයක් සමඟ මිශ්‍රකොට බාල කිරීමෙන් නොවිකිණිය යුතු බවද නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියෝග කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක ශුද්ධකළ සුදු සීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම ශුද්ධකළ සුදු සීනි ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍යය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කර එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබිය යුතු බව නියම කරමි.

(7) තවද මෙම නියෝගයේ කාර්යය සඳහා, " රාත්තල " හෙවත් " රා " යන්න සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(8) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම ශුද්ධකළ සුදු සීනි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම හා ශුද්ධකළ සුදු සීනි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම විසින් මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම්,

(අ) විකුණූ දිනය,

(ආ) විකුණූ ශුද්ධ කළ සුදු සීනි ප්‍රමාණය (බර අනුව),

(ඇ) විකුණූ ශුද්ධ කළ සුදු සීනි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල,

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්න වෙත නිකුත් කළ යුතු බව නියම කරමි.

(9) ශුද්ධකළ සුදු සීනි විකිණීමේදී යම් දෙයක ඔතනු ලැබේනම් හෝ බහාලනු ලැබේ නම් හෝ එහි මිළත් පළමුවැනි හා දෙවැනි උපලේඛනවල දෙවැනි තීරවල සඳහන් මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1966 දෙසැම්බර් මස 1 වැනි දින ප. ව. 2.30 ට ත්‍රිකුණාමල කච්චේරියේදී අත්සන් කරන ලදී.

ආර්. ජී. ජයතිස්ස,
සහකාර මිළ (ආහාර) පාලක,
ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය.

## පළමුවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>සීමාවන් | 2 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොන්ඩරයක තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. |
|---|---|
| ත්‍රිකුණාමල නගරය හා කඩවත් කරවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... | 73 60 |
| කන්තලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... | 73 70 |
| කින්නියා ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... ... | 73 73 |
| කට්ටුකුලම් පත්තු නැගෙනහිර සහ කට්ටුකුලම්පත්තු බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරින්ගේ කොට්ඨාශ ... | 73 70 |
| කොට්ටියාර් පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... | 74 17 |

## දෙවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>සීමාවන් | 2 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් සුද්ධකළ සුදු සිනි ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. |
|---|---|
| ත්‍රිකුණාමල නගර සහා ප්‍රදේශය සහ ත්‍රිකුණාමල නගරය හා කඩවත් කරවන ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි සාම්පල්තිවු, උප්පුවෙලි, වෙල්ලයිමනල්, චීනවරාය යන ග්‍රාමසේවක කොට්ඨාශයන් ... ... | 0 63½ |
| කට්ටුකුලම්පත්තුව බටහිර ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි පැනිකැටියාව, ගෝමරන්කඩවල, ගල්කඩවල, මැදවච්චිය යන ග්‍රාමසේවක කොට්ඨාශ සහ කට්ටුකුලම්පත්තුව නැගෙනහිර ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි කුඹුරුපිටි, නිලාවෙලි යන ග්‍රාමසේවක කොට්ඨාශයන් ... ... ... ... | 0 69 |
| කට්ටුකුලම්පත්තුව නැගෙනහිර ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි තෙන්නමරවාඩි, පරනමැදවච්චිය, පුල්මොට්ටෙයි, තිරියායි, කුච්චවෙලි යන ග්‍රාමසේවක කොට්ඨාශයන් ... ... ... | 0 70 |
| කන්තලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි කන්තලේ ග්‍රාමසේවක කොට්ඨාශය සහ කින්නියාව ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි තම්පලකාමම් දකුණ සහ තම්පලකාමම් උතුර යන ග්‍රාමසේවක කොට්ඨාශයන් ... | 0 69 |
| කින්නියාව ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි පෙරියකින්නියාව, සින්නකින්නියාව නැගෙනහිර සහ සින්නකින්නියාව බටහිර, කුරින්ජාකේනි යන ග්‍රාමසේවක කොට්ඨාශයන් ... ... ... | 0 69 |
| කොට්ටියාර්පත්තුව ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි මල්ලිකයිතිවු, තෝප්පූර්, පල්ලිකුඩියිරුප්පු, සම්පූර්, කට්ටයිපරිච්චාන්, සූනියිවු, මුතූර් මරක්කල සහ මුතූර් දෙමළ යන ග්‍රාමසේවක කොට්ඨාශයන් ... | 0 70 |
| කොට්ටියාර් පත්තුව ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ පිහිටි ඉච්චිලම්පත්තයි, මේන්කාමම් කිලිවෙට්ටි යන ග්‍රාමසේවක කොට්ඨාශයන් ... ... ... ... ... | 0 70 |

**සැලකිය යුතු.**—ඉහත සඳහන් මිල ගණන් ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය යුතු නියම මිල නොවේ. ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි වැඩිම මිල ගණන්ය. මේ මිල ගණන්වලට ඉහළින් එම ද්‍රව්‍යයන් විකිණිය නොහැක.

12–548/2

---

**ආහාර මිල නියෝග අංකය. ටී/6/66.** **හරක් මස්**

## මිල පාලන පනත

### නියෝගය

සහකාර මිල පාලක (ආහාර) වෙත (173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 3 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය සමඟ කියවෙන 4 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ත්‍රිකුණාමල පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල පාලක (ආහාර) තැන්පත්, රත්ගම ගුරුගේ ජයසේන වන මම, මෙම ආඥාව මගින්—

(1) අංක 14,032 හා 1964 ජූනි 6 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද අංක ටී/1/64 හා 1964 ජූනි 4 වැනි දින දරණ ආහාර මිල නියෝගය මෙයින් දැන් සිට අවලංගු කරමි.

(2) මෙයට යාකර ඇති උපලේඛනයේ 2, 3, 4 වන තීරයන්හි මුදුනේ සඳහන් වර්ගයට හා ශ්‍රෙණියට අයත් හරක්මස් ඒ උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් සීමාවන් තුළ විකිණිය හැකි වැඩිම මිල ලෙස වහාම ක්‍රියාත්මක වන සේ නියම කරමි.

(3) මෙම ආඥාවේ කාර්යය සඳහා—

(අ) "හරක් මස්" යන පාඨයෙන් හරකුන්ගේ සහ මීහරකුන්ගේ මස් අදහස් කරයි. එහෙත් සියළුම වර්ගයේ මාංසාවශේෂ ඉන් බැහැර කළ යුතුයි.

(ආ) සතකුගේ මළකුණ විකිණීම සඳහා මස් මඩුවෙහිදී පිළියෙල කොට ඇති අයුරින් (එනම් හිස, හම, බඩවැල්, මාංසාවශේෂ, කුර සහ සාමාන්‍යයෙන් ඉවත් කරන කොටස් හැර) විකුණන විට එය "තනිබර අනුව" කෙරෙන විකිණීමක් ලෙස සැලකිය යුතුය.

(4) කටු සහිත හරක් මස් විකිණීමේදී ඒ සමඟ විකුණු කටුවල බර විකුණු මුළු බරින් සියයට 25කට වැඩිවිය නොයුතුය.

(5) මෙයට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශය ඇතුළත වූ යම් ස්ථානයක එම උපලේඛනයේ 2 වැනි තීරයේ ඉහතින් සඳහන් වර්ගයට ශ්‍රෙණියට අයත් හරක් මස් තම සන්තකයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දෙකුම ඒ වර්ගයේ හෝ ශ්‍රෙණියේ හරක් මස් සම්බන්ධයෙන් මෙම ආඥාව මගින් නියමිත උපරිම මිල සඳහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ පැහැදිලිව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළ යුතුබව නියම කරමි.

(6) හරක්මස් විකිණිය යුත්තේ නැතහොත් විකිණීම සඳහා ප්‍රදර්ශනය කළ යුත්තේ ඒ සඳහා වෙන් කොට ඇති පිල්වල පමණක් වන අතර එම වෙළඳ පිල්වල වෙනත් වර්ගයක හෝ ශ්‍රෙණියක මස් විකිණීම හෝ විකිණීම පිණිස ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බව නියම කරමි.

(7) මෙයට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශය ඇතුළත වූ යම් ස්ථානයක ඒ උපලේඛනයේ සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක් මස් තම සන්තකයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දෙකුම ඒ වෙළඳ සැලෙහි එම වර්ගයට සහ ශ්‍රෙණියට හරක් මස් පමණක් විකුණන බවට ඒ හරක් මස් විකුණන වෙළඳ පිලෙහි පැහැදිලිව පෙනෙන සේ දැන්වීමක් ප්‍රදර්ශනය කළයුතු බව නියම කරමි.

(8) එක් ගණුදෙනුවක් කිරීමේදී හරක් මස් සමඟ මාංසාවශේෂ විකුණනු ලබන විට හරක් මස් මාංසාවශේෂ වලින් වෙන්කොට කිරා විකිණිය යුතු බව නියම කරමි.

(9) සෑම වෙළෙන්දෙකුම හරක් මස් විකුණන කල්හි, හරක් මස් ගැනුම්කරු මිළට ගන්නා හරක් මසෙහි සැබෑ බර පහසුවෙන් බලාගැනීමට හැකිවන සේ තම තරාදිය හෝ තරාදි තැබිය යුතු බව නියම කරමි.

(10) මෙයට යාකොට ඇති උපලේඛනයේ සඳහන් වර්ගයේ සහ ශ්‍රෙණියේ හරක් මස් විකුණන සෑම වෙළෙන්දෙකුම, හරක් මස් ගැනුම්කරු විසින් ඉල්ලා සිටි විට, පහත සඳහන් කරුණු දැක්වෙන කුවිතාන්සියක් ඔහුට දියයුතු බව නියම කරමි :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ හරක් මස් ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ හරක් මස් වර්ගය ; සහ

(ඈ) විකුණූ හරක් මස් ප්‍රමාණයට ගෙවූ මුදල.

(11) මෙම ආඥාවෙන් උපරිම මිළ නියම කරන ලද ප්‍රදේශය ඇතුළත කිසිවකු විසින් උපලේඛනයේ සඳහන් හරක් මස් කිසියම් මසක් හෝ මාංශයක් සමඟ කලවම් කර නොවිකිණිය යුතු බව නියම කරමි.

(12) උපලේඛනයෙහි සඳහන් හරක් මස් විකුණන කල්හි එම හරක් මස් ඔතා හෝ බහා දෙන ද්‍රව්‍යයක් වෙතොත් එහි මිළද උපලේඛනයේ 2, 3, 4 වන තීරයන් හි සඳහන් උපරිම මිළ ගණන්වලට ඇතුළත් වියයුතු බව නියම කරමි.

(13) මෙම නියෝගයේ කාර්යය සඳහා " රාත්තල " හෙවත් " රා." යන්න ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර ලෙස සැලකිය යුතු බව නියම කරමි.

1966 දෙසැම්බර් මස 1 වැනි දින ප. ව. 2.00 ට ත්‍රිකුණාමල කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ආර්. ජී. ජයතිස්ස,
සහකාර මිළ පාලක (ආහාර) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>හරක් මස් (කටු රහිත) රාත්තලක උපරිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>හරක් මස් (කටු සහිත) රාත්තලක උපරිම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>හරක් මස් (තනි බර අනුව) රාත්තලක උපරිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| ත්‍රිකුණාමල පාලන දිස්ත්‍රික්කය ... ... ... ... | 0 90 ... | 0 65 ... | 0 70 |

**සැළකිය යුතු.**—මෙම මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. ඒවා උපරිම මිළ ගණන්ය. මෙම මිළ ගණන්වලට ඉහලින් එම ද්‍රව්‍ය විකිණිය නොයුතුය.

12–548/3

---

ආහාර මිළ නියෝග අංකය : ටී/7/66 **එළු මස්**

## මිළ පාලන පනත

### නියෝගය

සහකාර මිළ පාලක (ආහාර) වෙත (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය සමඟ කියවෙන 4 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ත්‍රිකුණාමල පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් රත්ගම ගුරුගේ ජයතිස්ස වන මම, මෙම ආඥාව මගින් පහත සඳහන් නියමයන් කරමි :—

(1) 1960 පෙබරවාරි 1 වැනි දින සහ 12,051 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1960 ජනවාරි 26 වැනි දින සහ 2/ටී/60 වැනි අංකය දරණ මිළ නියෝගය මේ දන් සිට අවලංගු කරමි.

(2) මෙයට යාකොට ඇති උපලේඛනයේ 2, 3, වැනි තීරයන්හි සඳහන් මිළ, එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ගයට හා ශ්‍රෙණියට අයත් එළු මස් එම උපලේඛනයේ 1 වැනි තීරයේ වූ අනුරූප සටහනෙහි සඳහන් ප්‍රදේශය තුළ විකිණිය යුතු උපරිම මිළ ලෙස වහාම ක්‍රියාත්මක කළ යුතුය.

(3) මෙම නියෝගයේ කාර්යය සඳහා "එළු මස්" යන පාඨයෙන් එළුවන්ගේ සහ බැටළුවන්ගේ මස් අදහස් කරයි. එහෙත් සියළුම මාංශාවශේෂ ඉන් බැහැර කළ යුතුයි.

(4) කටු සහිත එළු මස් විකිණීමේදී ඒ සමඟ විකුණූ කටු වල බර, විකුණූ මුලු බරෙන් සියයට 25කට වැඩි නොවිය යුතුයි.

(5) මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක, එම උපලේඛනයේ සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් එළු මස් තම සන්තකයෙහි තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම ඒ වර්ගයේ හෝ ශ්‍රෙණියේ එළුමස් සම්බන්ධයෙන් මෙම ආඥාව මගින් නියමිත උපරිම මිළ සඳහන් දැන්වීමක් එකී ස්ථානයේ පැහැදිලිව පෙනෙන සේ ප්‍රදර්ශනය කළ යුතුය.

(6) එක් ගනුදෙනුවක් කිරීමෙදී එළු මස් සමඟ මාංශාවශේෂ විකුණන විට එම මාංශාවශේෂ වලින් වෙන්කොට කිරා විකිණිය යුතුය.

(7) සෑම වෙළෙන්දෙකුම එළු මස් විකුණන කල් හි, එම මස් ගැනුම්කරු විසින් මිළයට ගන්නා මසෙහි සැබෑ බර පහසුවෙන් බලා ගැනීමට හැකිවන සේ තම තරාදිය හෝ තරාදි තැබිය යුතුය.

(8) මෙයට යාකොට ඇති උපලේඛනයේ සඳහන් වර්ගයේ සහ ශ්‍රෙණියේ එළු මස් විකුණන සෑම වෙළෙන්දෙකුම ගැනුම්කරු ඉල්ලුවහොත්, පහත සඳහන් කරුණු දක්වෙන කුවිතාන්සියක් දිය යුතුය :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ එළුමස් ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ එළුමස් වර්ගය ; සහ

(ඈ) විකුණූ එළුමස් ප්‍රමාණයට ගෙවූ මුදල.

(9) මෙම ආඥාවෙන් උපරිම මිළ නියම කරන ලද ප්‍රදේශය ඇතුළත කිසිවකු විසින් උපලේඛනයේ සඳහන් භාණ්ඩය වෙන කිසියම් මසක් සමග හෝ මාංශයක් සමඟ හෝ කලවම් කොට නොවිකිණිය යුතුය.

(10) උපලේඛනයේ සඳහන් භාණ්ඩ විකුණන කල්හි එම භාණ්ඩය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක් වෙතොත් එහි මිළද මෙම උපලේඛනයෙහි 2 වැනි, 3 වැනි තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් විය යුතුය.

(11) මෙම නියෝගයේ කාර්යය සඳහා "රාත්තල" හෙවත් "රා." යන්න ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර ලෙස සැලකිය යුතුය.

1966 දෙසැම්බර් මස 1 වැනි දින ප.ව. 2.00ට ත්‍රිකුණාමල කච්චේරියේදී අත්සන් කරන ලදී.

ආර් ජී. ජයතිස්ස,
සහකාර මිළ (ආහාර) පාලක, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>එළු මස් (කටු රහිත)<br>රාත්තලක උපරිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>එළු මස් (කටු සහිත)<br>රාත්තලක උපරිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| ත්‍රිකුණාමල පාලන දිස්ත්‍රික්කය ... ... ... ... | 2 25 ... | 2 0 |

සැළකිය යුතු.—මෙම මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා, එම ද්‍රව්‍යය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැකිය.

12–548/4

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රපිතයි